සිංහලයිනි නැගිටියව් - බුද්ධ ගයාව බේරා ගනිවු - එදා මීට දශක කිපයකට පෙර ඇසූ කථාව නැවත පණ පොවන්නට වෙලාව පැමිණ ඇත.

අඩ සා මතින් නැතිනම් අඩ නිදිමතින් සියලු දේ අමතක කර හෙල බිමට නිගරු කරමින් ඇනුම් අරින්නට දැන් කාලය නොවේ. අවදිවන්න, පා නගන්න, වගකීමකින් යුතුව අලුත් හඩක් අලුත් විධියට නගන්නට මේ කාලයයි.

පමා වන්නට හේතු නොසොයමු. උරන වන්නට හේතු නොසොයමු. රට මට කලේ මොකක්දැයි විමසනු වෙනුවට මම රටට කලේ කුමක් දැයි මොහොතකට හිතමු. රටෙන් ණයගෙන රටට ණයකාරයකුලෙස මිය ගොස් රට ගොඩ නැගීමේ මහගු කාර්යයට දායක නොවන ගුණමකුවෙකු වීම අපට තරම් නොවේ.

නැත පමාවෙන්නට හේතු. හිතවත, ඔබ ලොව කොතැනක හිටියත් මොන පාට ඇන්දත් ඒ පාට පුංචි පුංචි කැලිවලට කැපීම වෙනුවට එක්කර ඒ ගැන රස කතා ලියන්නට සමගියේ බලය පෙන්වන්නට මේ සුදුසුම කාලයයි.

අද හෙල හඩ ඔබට ඒ ශක්තිය බලය දෙන්නට ඔබ අතරට එක්වන්නේ දහසකුත් එකක් බලාපොරොත්තු හා දැඩි අදිටනෙන් යුතුවයි. පටු රාමු වල රැදී ජාතී ආගම් කුලමල නොසොයා දේශපාලනය රස්සාවක් කර නොගෙන සල්ලි වලට හෙම්බිරිස්සාව හදා ගන්නට වැර නොදරා අභිමානයෙන් යුතුව හෙල හඩ වටා එක් වන්න ඔබට මේ ආරාධනා.

දකුනේ දීකිරි කැවත්, නාවල අන්නාසි කෑවත්, උතුරේ තල් හකුරු කෑවත්, තිරිකුනාමලේ කලපු මාලු කැවත් රජරට කැකැලු හාල් කෑවත් උඩරට තේ කෝප්පයක් නොබොන කෙනෙක් මේ හෙල බිම හොයන්නට නැත. ලොව කොතැන හිටියත් ලංකාවේ තේ කෝප්පයක රස බලන්න අකැමැති කෙනෙක් නැත. මේ අපේ හෙල බිමේ අයිතියයි. මේ අපේ හෙල බිමේ රසයි.

අපේ අම්මට තාත්තට සීයට මුත්තට කිත්තට කිරි කිත්තට නත්ත පනත්තට පිං සිදුවන්න අපට හොද ඉතිහාසයක් ඇත. මේ උරුමය හෙට ඉපදෙන පුංචි පුතාට පුංචි දියනියට ඉතුරු නොකර නිකමෙකුලෙස මිය ඇදෙන්නට මට හැකියාවක් නැත. ලස්සන මල්වතු ලස්සන දිය ඇලි සරුසාර කෙත්වතු සමග මේ උරුමය හෙට පරපුරට දිම මගෙත් ඔබෙත් යුතුකමයි.

දැස නොපෙනෙන මිනිසුන් ලෙස එකිනෙකා ඇණ කොටා ගනිමින් මිනිස් ජීවිත නැති කරන බල අරගල නවතා අට ලෝ දහමට කම්පා නොවී අතට ගත් බත් පත එකට බෙදාගෙන කන්නට හිත ඇති බල ඇති සමගියේ උරුමය ලොවට කියා දීම හෙල හඩේ අරමුනයි.

හෙල බිම උපන් ඔබ ලොව කොතැන හිටියත් අවුරුදු දෙදහස් පන්සීයකට අධික පෞඪ ඉතිහාසයකට උරුම ඇති මමත් ඔබත් අවදිවී හෙලයන් ලෙස හඩ නගමු..

ඇත්ත වටහා ගනිමින් එකමුතු බවේ සංකේතය අභිමානයෙන් ලොවට කියන්නට තොරතුරු තාක්ෂනය අත්වැලක් කර ගනිමින් හෙල හඩ විකාශනයතුලින් හෙට ගැන අලුත් දැනුමකින් එලිය බලන්නට එක් වන්නටයි මේ ආරාධනය ඔබට.